(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 2(9).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2011 පෙබරවාරි මස 24 වැනි බ්‍රහස්පතින්දා**

## 2011 මාර්තු මස 08 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0040/’10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා රජයට ණය මුදල් ලබා දී ඇති රටවල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ බැංකු සහ පෞද්ගලික ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට ගෙවීමට ඉතිරිව තිබෙන ණය ප්‍රමාණය කොපමණද;

(iii) 1999 වර්ෂය අවසාන වන විට ගෙවීමට ඉතිරිව තිබූ ණය ප්‍රමාණය කොපමණද;

(iv) 1999 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී රටවල් හෝ ආයතන විසින් ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(v) ණය පොලී අනුපාතිකයන් සහ ණය ආපසු ගෙවිය යුතු කාල පරිච්ඡේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ දක්වා ලබාගෙන ඇති ණය මුදල්ද සමග වර්ෂ 2000 සිට 2015 දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂය සඳහා සම්පූර්ණ ණය ක්‍රමක්ෂය (මුල් ණය මුදල සහ පොලී ගෙවීම්) කොපමණද;

(ii) ඉහත දක්වා ඇති දත්ත ඇමරිකානු ඩොලර්වලින් සහ විශේෂ ගැනුම් හිමිකම් (SDR) වලින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, ඒ එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ ඉඩමේ ස්වභාවය කවරේද;

(iii) එක් එක් ඉඩමේ වාර්ෂික ආදායම කොපමණද;

(iv) එම ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පුද්ගලයන්ට හෝ ආයතනවලට පවරා තිබේද;

(v) එසේ නම්, ඉඩම් පවරාදුන් කාර්යය සහ පදනම කවරේද;

(vi) ඉඩම්ලාභී පුද්ගලයන්ගේ හෝ ආයතනවල නම, ලිපිනය, පවරා දුන් දිනය, ඉඩමේ ප්‍රමාණය හා කාල සීමාව කවරේද;

(vii) එක් එක් ඉඩමෙන් කොමිෂන් සභාවට ලැබෙන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) කොමිෂන් සභාවේ ඉඩම් නීත්‍යානුකූල නොවන අයුරින් පුද්ගලයින් හෝ ආයතන විසින් භුක්ති විඳින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම්, භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය සහ කාල සීමාව කවරේද;

(iii) ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග සහ එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iv) ආරම්භයේදී හා මේ වනවිට කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) ආරම්භයේ තිබූ ඉඩම් ප්‍රමාණයෙන් අන්සතු කළ ප්‍රමාණය කොපමණද;

(vi) සන්තකය අන්සතු කළ අයගේ නම්, ලිපිනයන් සහ ඉඩම් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(iii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0517/'10

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ පෝෂණ ඌනතා ඇති දරුවන් සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ දැනට සිටින අවුරුදු පහට අඩු මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) උතුරු නැගෙනහිර ප්‍රදේශයේ සිටින මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දරුවන්ගේ පෝෂණය නැංවීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන වැඩසටහන් කවරේද;

(ii) එම වැඩසටහන් යටතේ සිටින ප්‍රතිලාභීන් ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0533/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - අම්පාර - කාරතිව් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0560/10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ස.තො.ස. ආයතනයේ සිල්ලර ගබඩා පැය 24 පුරා විවෘතව තැබූ කාල සීමාවේදී එම ආයතනය භාරව කටයුතු කළ අමාත්‍යවරයා කවරෙක්ද;

(ii) එම අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ජනාධිපති ලේකම්ගේ අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අනුමත නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ තනතුරු නාමයන් කවරේද;

(iii) එම තනතුරු හෙබවූ නිලධාරීන්ගේ නම්, ලිපිනයන්, ලැබූ වැටුප් හා දීමනාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අමාත්‍යවරයා අමාත්‍ය පදවිය දැරූ කාල සීමාවේදී ඔහුගේ කාර්ය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් හා ස.තො.ස වැනි අනුබද්ධ සමාගම්වලින් අනුයුක්ත කරන ලද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, දැරූ තනතුරු, වැටුප්, දීමනා සහ ලැබූ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අමාත්‍ය කාර්ය මණ්ඩලයට අනුයුක්ත කිරීමට පෙර සේවය කළ ආයතන හා දැරූ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0569/'10

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ 2008, 2009 සහ 2010 වර්ෂවලදී ඩෙංගු රෝගය වැළඳුන රෝගීන් සංඛ්‍යාව සහ ඩෙංගු රෝගය නිසා මියගිය රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය සීඝ්‍ර ලෙස ව්‍යාප්තවීමේ අනතුරට මුහුණපා ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශය තුළ ඩෙංගු රෝගය මර්ධනය කිරීම සඳහා මේ වන විට ගෙන ඇති විශේෂිත පියවර කවරේද;

(iii) ඒ සඳහා ඉදිරියේදී ගනු ලබන වෙනත් විශේෂිත පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0834/'10

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලබා ගන්නා ලකුණු අනුව 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගනු ලබන මුල් පාසල් 50 තුළ 2009 සහ 2010 වර්ෂවල පැවති ශිෂ්‍යත්ව විභාගයන්ගෙන් සමත් සිසුන් සඳහා 2010 සහ 2011 වර්ෂයන්හිදී වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සියලු පාසල් තුළ හෝ ඇතැම් පාසල් තුළ 2009 වර්ෂයේ විභාගය සමත් වූ සිසුන් සඳහා 2010 වර්ෂයේදී 6 ශ්‍රේණියෙන් වෙන්කල පුරප්පාඩු ප්‍රමාණයට වඩා, 2010 වර්ෂයේදී සමත්වූ සිසුන් සඳහා 2011 වර්ෂයේ වෙන් කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව අඩුවී තිබේද;

(ii) එවැනි අඩුවීමක් තිබේ නම්, ඊට හේතු කවරේද;

(iii) 6 ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාවේ අඩුවීමක් තිබේ නම්, අවම වශයෙන් 2010 දී වෙන්කළ පුරප්පාඩු ප්‍රමාණය 2011 දී ද වෙන්කර දීමට පියවර ගන්නේද;

(iv) නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තහවුරු කිරීම සඳහා, ශිෂ්‍යත්ව විභාගය සමත්වන සිසුන් වෙනුවෙන් දිවයිනේ ජනප්‍රිය පාසල්වලින් වෙන් කරනු ලබන පුරප්පාඩු ප්‍රමාණය ඉදිරියේදී අඩු නොකර පවත්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0998/’10

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010/2011 වර්ෂය තුළදී උතුරු හා නැගෙනහිර පළාත්වල ගොවි ජනතාවගේ බිත්තර වී අවශ්‍යතාව සපුරාලනු පිණිස එක් ගොවි මහතෙකුට බිත්තර වී බුසල් 3 බැගින් සැපයීමට ලෝක ආහාර සංවිධානය මගින් මූල්‍ය පහසුකම් සලසා දී තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර දී ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ගොවි ජනතාවට අවශ්‍ය බිත්තර වී සැපයීමට අදාළව මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත බිත්තර වී සැපයුම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය මිලදී ගෙන ඇත්තේ සහතික කළ බිත්තර වී නිෂ්පාදන ගොවි සංවිධානයන්ගෙන්ද; නැතහොත් පෞද්ගලික සමාගම් වෙතින්ද;

(ii) බිත්තර වී මිලදී ගැනීමේදී බුසලක් වෙනුවෙන් ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2010.05.01 දින සිට 2010.07.01 දින දක්වා කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0518/’10

ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගැබිනි මව්වරුන් සහ කිරි දෙන මව්වරු අතරින් යකඩ ඌනතාවයෙන් පෙලෙන සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ පෝෂණය නැංවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අඩු බර දරු උපත් සංඛ්‍යාව කොපමණද;

(iv) අවුරුදු 5ට අඩු දරුවන් අතරින් යකඩ ඌනතාවයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උතුරු නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් ඉහත (අ) (i), (ii) සහ (iv) ට අදාළ සංඛ්‍යා ලේඛන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0541/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, ඇල්ල - කන්තලේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0637/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂය අවසන් වන විට ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි විවිධ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රවල නියුතු ශිල්පීන් සංඛ්‍යාව කවරේද;

(ii) මෙරට හස්ත කර්මාන්තයේ නියුතු ශිල්පීන් විසින් මුහුණදෙන අමුද්‍රව්‍ය සොයාගැනීමේ දුෂ්කරතාවයට පිළියම් වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හස්ත කර්මාන්ත ශිල්පීන් සතු දැනුම සංරක්ෂණයට හා අනාගත පරපුරට උරුම කරදීම සඳහා ක්‍රියාත්මක වැඩ පිළිවෙලක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0546/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ආරුගම්බේ පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම් ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0600/'10

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ලෝක කුසලාන ක්‍රිකට් තරඟ කවරේද;

(ii) ලෝක කුසලාන තරඟාවලියේ ශ්‍රී ලංකාව අනුග්‍රාහකත්වය දක්වන කොටස වෙනුවෙන් දැරීමට අපේක්ෂා කරන වියදම කොපමණද;

(iii) ආදායම ලබා ගැනීමට බලාපොරොත්තුවන ආකාරය කවරේද;

(iv) අපේක්ෂිත ප්‍රේක්ෂක සංඛ්‍යාව කවරේද;

(v) එම ප්‍රේක්ෂකයන් අතරින් විදේශ රටවලින් පැමිණෙතැයි අපේක්ෂා කරන ප්‍රේක්ෂක සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ තිබෙන ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ සංඛ්‍යාව කවරේද;

(ii) මෙම ක්‍රීඩාංගණ නඩත්තු කිරීම සඳහා යන මාසික වියදම කොපමණද;

(iii) ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලිය සඳහා සකස් කර ඇති නව ක්‍රීඩාංගණවල නම් කවරේද;

(iv) මෙම එක් එක් ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා යන වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 සැප්තැම්බර් 20 දිනැති අංක 1672/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 1677/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 09 දිනැති අංක 1683/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.02.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලය පනත යටතේ යෝජනාව,— 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (6) වැනි ඡේදය සමග කියවිය යුතු, 62 වැනි වගන්තිය යටතේ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2010 දෙසැම්බර් 18 දිනැති අංක 1684/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.24 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2011 මාර්තු මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0315/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, එම ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/'10

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'10

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 අගෝස්තු දක්වා කාල සීමාවේදී කොරියානු රජය මගින් ශ්‍රී ලංකාවට ලබා දුන් විදේශ රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා අවස්ථාවක් ලබා ගැනීමට පුද්ගලයකු විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම රැකියා සඳහා පිටත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොරියානු රැකියාවක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වී සිටින සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ කොරියානු රැකියා අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගුවන කාල සීමාව කවරේද;

(ii) ඉහත ලියාපදිංචිය අවලංගු වූ රැකියා අපේක්ෂකයෙකු කොරියාවේ රැකියාවක් ලබා ගැනීම සඳහා නැවත අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මේ සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචිවී සිටින රැකියා අපේක්ෂකයින් හට ප්‍රමුඛත්වය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බඳු නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2006 වර්ෂයේ පැවැත්වූ බවත්;

(ii) එම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 16,000 ක් අතරින්, 1000 ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත්:

(iii) එම පිරිසෙන් 550 දෙනෙකුට 2007 වර්ෂයේ අප්‍රියෙල් 01 වන දින සිට පත්වීම් ප්‍රදානය කළ බවත්;

(iv) එම පත්වීම්ලාභීන් අතර මෙම විභාගයට අදාළව 2006 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයේ සඳහන් දිනට උපාධි සහතිකය නොමැති අය සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බඳු නිලධාරීන් ලෙස ඉහත පත්වීම් ලැබූ එක් එක් අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006.12.08 දින පෙරවරු 9.30 ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ජා-ඇල, නැගෙනහිර තුඩැල්ල, අංක 76/සී හි පදිංචි ඩබ්ලිව්. ඒ. එස්. එම්. සෝවිස් මහත්මිය එම විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0780/’10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට විදේශ රටවල සේවයේ නියුතු විවාහක ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මෙරට සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එම දරු දැරියන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද?

(iii) එවැනි වැඩසටහන් සඳහා රජය වර්ෂයකට වැය කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0317/’10

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබාගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද;

(vii) පසුගිය වර්ෂ හය තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහල යැමට හේතුවී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබාගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද; සහ

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0575/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට එක් එක් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ගේ සංඛ්‍යාව පාසල් වර්ගීකරණය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) පසුගිය අයවැය යටතේ ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ 50/2008 හි 2 කොටසේ VI වැනි වගන්තියට යටත් ස්වේච්ඡා ගුරුවරුන් මේ වන තෙක් ස්ථිර සේවයේ පිහිටුවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0781/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට නැගෙනහිර පළාත තුළ පදිංචි, ත්‍රිවිධ හමුදා, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බළකාය සහ සිවිල් ආරක්ෂක සේවයේ යෙදී සිටියදී තම ස්වාමි පුරුෂයන්, අහිමිවූ කාන්තාවන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැන්දඹු කාන්තාවන් වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

(iii) ඔවුන්ගේ දරුවන් සම්බන්ධයෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන් වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද; සහ ඔවුන් කවර ප්‍රදේශවලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි ණය ලබාගත් සංඛ්‍යාව;

(ii) එම ණය ලබා දී ඇති පොලී අනුපාතිකය;

(iii) ණය ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත;

(iv) මේ වන විට අය කර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ණය ලබාගත් සමෘද්ධිලාභීන්ගෙන් ණය අයකර ගැනීමේදී නිලධාරීන් අත්තනෝමතික ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0782/'10

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ පදිංචි උපතින්ම අබාධිත සහ විවිධ අනතුරු හා රෝගාබාධවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආබාධිත පුද්ගලයන් සඳහා රජය මගින් සලසනු ලබන සහන සේවාවන් කවරේද;

(iii) ඒ සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?